# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2011
2012 දෙසැම්බර් / 2013 ජනවාරි

මානවශාස්ත්‍ර පීඨය

ප්‍රාසංගික කලා - PART E2025

ශ්‍රී ලංකාවේ ගැමි නාට්‍යය සහ ගැමි සංගීත සම්ප්‍රදා

<u>ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.</u>

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

01. සිංහල ජන ගී සම්ප්‍රදායක් ගොඩනැගීමට හේතු වූ මූලික සාධක පිළිබඳ විමර්ශනය කරන්න.

02. ලී කෙලි, කලගෙඩි සහ කුළු යන ගැමි නර්තනාංගවල එන ගායනාවලින් අනාවරණය වන සමාජ හා සංස්කෘතික පසුබිම පිළිබඳ විග්‍රහයක් කරන්න.

03. හටන් කවි, ප්‍රශස්ති සහ විරිදු හඳුන්වා දෙමින් ඒවා එකිනෙකින් වෙනස්වන ආකාරය පැහැදිලි කරන්න.

04. කෙටි සටහන් ලියන්න.

    1. නෙළුම් කවි
    2. සිරස පාද කවි
    3. මල් යහන් කවි
    4. යාග ගී

05. සොකරි නාටකයේ භාවිත විරිත් හා පද්‍ය ආකෘති නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

06. සින්දු නාඩගම් සම්ප්‍රදාය විසින් අනුගත සංගීතය පිළිබඳ විමර්ශනයක් කරන්න.

07. නාඩගම අංග සම්පූර්ණ නාටකයක් වශයෙන් සැලකීමට හේතු විග්‍රහ කරන්න.

08. වෙස්මුහුණු මගින් කෝලම් නාටකයේ චරිත විවරණය වන ආකාරය විග්‍රහ කරන්න.

09. කෝලම් නාටකයේ අධිමානුෂ හා සත්ත්ව චරිත පිළිබඳ විමර්ශනයක් කරන්න.

10. සොකරි නාටකය යාතුකර්මයක් වශයෙන් ද හැඳින්වීමට හේතු පැහැදිලි කරන්න.

*****************************